(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **27.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2020 නොවැම්බර් 20 සිකුරාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අළෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඞ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **නසීර් අහමඩ් මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **(මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු **සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **සාගර කාරියවසම් මහතා**

ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු ජයන්ත කැටගොඩ මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු ජගත් කුමාර මහතා
ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා
ගරු අ. අරවින්ද් කුමාර් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු ඩයනා ගමගේ මහත්මිය
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු යදාමිණී ගුණවර්ධන මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු එම්. එස්. තවුෆික් මහතා
ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු රෝහණ දිසානායක මහතා
ගරු සාරතී දුෂ්මන්ත මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු ගයාෂාන් නවනන්ද මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු මනූෂ නානායක්කාර මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා
ගරු සු. නෝගරාදලිංගම් මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු නිමල් පියතිස්ස මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු හරීන් ප්‍රනාන්දු මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු රෝහණ බංඩාර මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**

**ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා**

**ගරු රන්ජන් රාමනායක මහතා**

**ගරු එම්. රාමේෂ්වරන් මහතා**

**ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**

**ගරු ගාමිණී වලේබොඩ මහතා**

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**

**ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**

**ගරු මධුර විතානගේ මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ජනාධිපතිවරයාගෙන් ලද සංදේශ :** අතිගරු ජනාධිපතිතුමාගෙන් ලැබුණු මතු පළවන සංදේශය නියෝජ්‍ය කථානායකවරයා විසින් කියවන ලදී.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2020 නොවැම්බර් මස 17 වන දින

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

**ගෝඨාභය රාජපක්ෂ**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) විදේශ අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා කාන්තා, ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) මැල්සිරිපුර, පල්ලෙකැන්දවිල, පදිංචි පී. කේ. බී. ගුණතිලක මහතාගෙන් ලැබුණු 2020.09.16 දිනැති පෙත්සම ගරු තේනුක විදානගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මාතලේ, කයිකාවල, කොහිලවත්ත යන ලිපිනයෙහි පදිංචි ඒ. ටී. එම්. සෝමසිරි බණ්ඩා මහතාගෙන් ලැබුණු 2020.09.16 දිනැති පෙත්සම; සහ

(ii) ගලේවෙල, බඹරගස්වැව, කටුපොත, අංක 401 දරන ස්ථානයෙහි පදිංචි බී. ඩබ්ලිව්. ඩී. එම්. කේ. ධර්මකීර්ති මහත්මියගෙන් ලැබුණු 2020.09.14 දිනැති පෙත්සම

ගරු රෝහණ දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) දඹදෙනිය, විජේකෝන් මාවත යන ලිපිනයෙහි පදිංචි ඒ. ටී. තිලක් එදිරිසිංහ මහතාගෙන් ලැබුණු 2020.09.14 දිනැති පෙත්සම;

(ii) අලව්ව, නවතල්වත්ත, බෝගහවත්ත, අංක 213 දරන ස්ථානයෙහි පදිංචි අයි. ආර්. ඩී. ඉඹුලාන මහතාගෙන් ලැබුණු 2020.10.04 දිනැති පෙත්සම; සහ

(iii) අවුලේගම, කොළඹ ගෙදර යන ලිපිනයෙහි පදිංචි එම්. ජයතිස්ස මහතාගෙන් ලැබුණු 2020.09.02 දිනැති පෙත්සම

ගරු ශාන්ත බණ්ඩාර මහතා විසින් පිළිගන්වන ලදී.

(4) කොලොන්නාව, සාලමුල්ල, අයි.ඩී.එච්. පාර, නො. 51/1/3 දරන ස්ථානයෙහි පදිංචි එම්.එච්.කේ. රහුමාන් මහතාගෙන් ලැබුණු 2020.08.25 දිනැති පෙත්සම ගරු එස්. එම්. මරික්කාර් මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—2020 නොවැම්බර් 23 සඳුදා, 24 අඟහරුවාදා, 25 බදාදා, 26 බ්‍රහස්පතින්දා, 27 සිකුරාදා, 28 සෙනසුරාදා, 30 සඳුදා සහ 2020 දෙසැම්බර් 01 අඟහරුවාදා, 02 බදාදා, 03 බ්‍රහස්පතින්දා, 04 සිකුරාදා, 05 සෙනසුරාදා, 07 සඳුදා, 08 අඟහරුවාදා, 09 බදාදා, 10 බ්‍රහස්පතින්දා "විසර්ජන (2021) පනත් කෙටුම්පත" සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, “විසර්ජන (2021) පනත් කෙටුම්පත” සලකා බැලීම සඳහා 2020 නොවැම්බර් 23 සඳුදා සිට 30 සඳුදා දක්වා ද, 2020 දෙසැම්බර් 01 අඟහරුවාදා සිට 09 බදාදා දක්වා ද, වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 5.30 දක්වා ද විය යුතු ය:

එසේ වුවද, අ. භා. 5.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 (4), (5) සහ (6) ඡේද හි විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, “විසර්ජන (2021) පනත් කෙටුම්පත” සලකා බැලීම සඳහා වෙන් කළ, 2020 දෙසැම්බර් 10 බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**7. විසර්ජන (2021) පනත් කෙටුම්පත — (තෙවැනි වෙන් කළ දිනය) :** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2020 නොවැම්බර් 17),—

“පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

(පූ.භා. 11.15 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

“ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.00 ට ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.)

“ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය”යි බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.55 ට ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.)

“ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි වාරිමාර්ග අමාත්‍ය සහ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.49 ට ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 5.00 වූයෙන්, විවාදය කල් ගියේය; එතැන් සිට විවාදය 2020 නොවැම්බර් 21 සෙනසුරාදා පවත්වනු ලැබේ.

**8. කල් තැබීම (කල්මුණේ උතුර දෙමළ උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස උසස් කිරීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2020 නොවැම්බර් 13 දින සභා සම්මතිය අනුව, 2020 නොවැම්බර් 21 සෙනසුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.